## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ධීවර අමාත්‍යාංශය

### විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) දෙපාර්තමේන්තුගත තනතුර සඳහා බඳවා ගැනීම.

ධීවර අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) දෙපාර්තමේන්තුගත තනතුරේ පවතින පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් ධීවර අමාත්‍යාංශයේ සංවෘත/ දෙපාර්තමේන්තුගත තනතුරු දරන නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අභ්‍යන්තරව අයදුම්පත් කැඳවනු ලැබේ.මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර පහත සඳහන් දිනට හෝ ඊට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) වෙත භාරදිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ "විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) දෙපාර්තමේන්තුගත තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනය 2021.11.10 දින වේ.

1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) දෙපාර්තමේන්තුගත තනතුරට බඳවා ගනු ලැබේ.

එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 09 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

    i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබ වැන්දඹු හා අනාත්දරු/ වැන්දඹු පුරුෂ හා අනාත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

    ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

    iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, රජයේ මුදල් රෙගුලාසිවලටද ධීවර අමාත්‍යාංශයේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානවලටද ඉහත රීති, විධිවිධාන හා රෙගුලාසිවලටද දැනටමත් සිදුකර ඇති හා ඉදිරියේදී සිදු කරනු ලැබිය හැකි සංශෝධනවලටද මෙම පත්වීම යටත් වේ.

3. වැටුප් පරිමාණය:

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016, රු.47,615- 10x1,335 - 8x1,630 -17x2,170–රු.110,895/= ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

4. අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස්පෙළ විභාගයේ පැරණි විෂය නිර්දේශය යටතේ නම්, විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් තුනක් හෝ නව නිර්දේශය යටතේ නම්, විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් තුනක් සමත් වීම.

5. පළපුරුද්ද:

I. <u>උපාධිය සහිත අයදුම්කරුවන් සඳහා</u>:-

ධීවර අමාත්‍යාංශයේ සංවෘත (දෙපාර්තමේන්තුගත) සංවර්ධන නිලධාරි, නීති සහකාර, වැඩසටහන් සහකාර, ගිණුම් සහකාර, සැපයුම් සහකාර, සැලසුම් සහකාර, සංවර්ධන සහකාර යන තනතුරක ස්ථිර වී තිබීම සහ අමාත්‍යාංශයේ අදාළ තනතුරේ පස් (05) අවුරුදු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

II. <u>උපාධිය රහිත අයදුම්කරුවන් සඳහා</u>:-

ධීවර අමාත්‍යාංශයේ සංවෘත (දෙපාර්තමේන්තුගත) සංවර්ධන නිලධාරි, ගුවන් විදුලි වැඩසටහන් සම්පාදක යන තනතුරකට පත්වීම ස්ථිර වී තිබීම සහ අදාළ තනතුරේ දස (10) අවුරුදු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

<u>සටහන</u>:-

- උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසාන දිනය හෝ ඊට පෙර දිනයක් දිනයක් විය යුතුය.

6. වයස් සීමාව :

අදාළ නොවේ.

7. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

8. වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

II. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

9. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

පහත සඳහන් විස්තරාත්මක ලකුණු පරිපාටියට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත උපරිම ලකුණු ප්‍රමාණයක් ලබා ගත් අයදුම්කරුවකු තනතුරට බඳවා ගනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදාන ආයතනයකින් ධීවර විද්‍යාව හෝ සාගර විද්‍යාව ක්ෂේත්‍රවල, | | 10 |
| i. පශ්චාත් උපාධිය - පර්යේෂණ පාදක | 10 | |
| ii. පශ්චාත් උපාධිය - පාඨමාලා පාදක | 09 | |
| iii. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 08 | |
| iv. උපාධිය | 07 | |
| සටහන : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු පිරිනැමේ. | | |

| | | |
|---|---|---|
| **2.** වෘත්තීය සුදුසුකම්<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ධීවර ක්ෂේත්‍රයට අදාළව ලබාගත්,<br><br>i. ඩිප්ලෝමාව<br>(වසරකට නොඅඩු)<br>ii. සහතිකපත්‍ර පාඨමාලාව<br>(මාස 06කට නොඅඩු)<br><br><u>සටහන I</u> : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු පිරිනැමේ. | <br><br><br><br><br>10<br><br>05 | 10 |
| **3.** අතිරේක පළපුරුද්ද<br><br>මෙම නිවේදනයේ (5) වගන්තියේ සඳහන් මූලික සුදුසුකම සම්පූර්ණ කළ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය දක්වා එම වගන්තියේ සඳහන් අදාළ තනතුරක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 2019/01 හා 2019/01(I) අනුව ලකුණු පිරිනැමේ. | | 35 |
| **4.** ක්ෂේත්‍රය සඳහා දායකත්වය<br><br>(I) 1. ධීවර විද්‍යා හෝ සාගර විද්‍යා ක්ෂේත්‍රයට අදාළව ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක/ සම්මන්ත්‍රණයක (Journal/ Symposium) පළකර ඇති පර්යේෂණ පත්‍රිකා - ප්‍රධාන පර්යේෂක.<br><br>2. ධීවර විද්‍යා හෝ සාගර විද්‍යා ක්ෂේත්‍රයට අදාළව ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක/ සම්මන්ත්‍රණයක (Journal/ Symposium) පළකර ඇති පර්යේෂණ පත්‍රිකා - ප්‍රධාන පර්යේෂක නොවන.<br><br>(II) 1. ධීවර විද්‍යා හෝ සාගර විද්‍යා ක්ෂේත්‍රයට අදාළව ජාතික වශයෙන් පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක/ දෙපාර්තමේන්තු ප්‍රකාශනයක/ සම්මන්ත්‍රණයක පළකර ඇති පර්යේෂණ පත්‍රිකා - ප්‍රධාන පර්යේෂක.<br><br>2. ධීවර විද්‍යා හෝ සාගර විද්‍යා ක්ෂේත්‍රයට අදාළව ජාතික වශයෙන් පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක/ දෙපාර්තමේන්තු ප්‍රකාශනයක/ සම්මන්ත්‍රණයක පළකර ඇති පර්යේෂණ පත්‍රිකා - ප්‍රධාන පර්යේෂක නොවන. | <br><br>15<br><br><br><br><br>12<br><br><br><br><br>10<br><br><br><br><br>08 | 15 |

| | | |
|---|---|---|
| 5. පරිගණක දැනුම | | 10 |
| (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත්, | | |
| i. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | 10 | |
| ii. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් වූ උපාධිය | 05 | |
| iii. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව | 03 | |
| (ආ) රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත්, | | |
| i. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමාව | 03 | |
| ii. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර (පුහුණුව/ පාඨමාලාව පැය 360 හෝ මාස 03 කට නොඅඩු විය යුතුය.) | 02 | |
| iii. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර (පුහුණුව පැය 360 කට අඩු) | 01 | |
| (ඇ) වෙනත් පිළිගත් පුහුණු ආයතනයකින් ලබා ගත් | | |
| i. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමක ඩිප්ලෝමාව | 03 | |
| ii. පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 4 හෝ ඊට ඉහළ මට්ටමක සහතිකපත්‍ර | 02 | |
| (ඇ) පිළිගත් ජාතික පරිගණක සංගමයක සාමාජිකත්වය | 05 | |
| (ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් ධීවර විද්‍යාව හෝ සාගර විද්‍යාවට අදාළ පරිගණක යෙදවුම් පිළිබඳ පුහුණු සහතිකයක්. | 02 | |
| සටහන I : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු පිරිනැමේ | | |
| 6. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | | 15 |
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධියක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම (නිබන්ධනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉදිරිපත් කර තිබිය යුතුය.) හෝ පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක (Journal)/ දෙපාර්තමේන්තු ප්‍රකාශනයක ඉංග්‍රීසි මාධ්‍යයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ප්‍රධාන පර්යේෂක වශයෙන් පළකර තිබීම. | 15 | |

| | | |
|---|---|---|
| (ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ නිලධාරීන්ගේ පුහුණු ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. | 12 | |
| (ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS (Academic) සමස්ථ ලකුණු 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම | 10 | |
| (ඈ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ නිලධාරීන්ගේ පුහුණු ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතිකපත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 4 මට්ටමේ සහතිකයක්.<br><br>සටහන !: ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු පිරිනැමේ. | 08 | |
| **7. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය** | | 05 |
| i. විශ්ලේෂණ හැකියාව හා තාර්කික කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව | 02 | |
| ii. ධීවර කර්මාන්තයට හා සාමුද්‍රික පරිසරය හා සම්පත්වලට අදාළ කාලීන ගැටළු පිළිබඳ අවබෝධය | 02 | |
| iii. නායකත්ව කුසලතා | 01 | |
| එකතුව | | 100 |

10. මූලික සුදුසුකම සහ අමතර සුදුසුකම සනාථ කිරීමට අවශ්‍ය සියලු සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් තනතුරට පත් කිරීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක ඔබ නැවත පෙර තනතුරට යැවීමට කටයුතු කරනු ඇත.

12. මෙම පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍යසේවා කොමිෂන් සභාව සතුවේ.

13. මෙම ගැසට් නිවේදනයේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

14. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇතිවුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

.............................................

ලේකම්,

ධීවර අමාත්‍යාංශය.

2021 ඔක්තෝබර් මස 06 දින

ආර්.එම්.අයි. රත්නායක
ලේකම්
ධීවර අමාත්‍යාංශය
02 වන මහල, නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ - 10.